Wondershare PDFelement

# තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
# වෘත්තීය දැනුම ඇගයීමේ පරීක්ෂාව- 2022 අප්‍රේල්
# පෙරපාසල් ගුරු
# ජාතික වෘත්තීය සුදුසුකම - 4 වන මට්ටම

**කාලය - පැය 03**

## විභාග අපේක්ෂකයන් හට උපදෙස්

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 50 දක්වා වූ ප්‍රශ්නවල , දී ඇති (a), (b), (c), (d) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න
- මෙම ප්‍රශ්න පත්‍රයෙහි පිටු 08 ක් අඩංගු වේ.

---

## 1 කොටස

1. කථන නිපුණතා වර්ධනය කිරීමේදී සැලකිල්ලට ගතයුතු වැදගත් කරුණු වන්නේ,
   i). දරුවන් උපතේ සිටම අනුක්‍රමයෙන් කථා කිරීමට ඉගෙන ගන්නා බව
   ii). පුළුල් වූ තම පරිසරය තුල ලබන අත්දැකීම් තුලින් ඔවුන් වැඩියෙන්ම ඉගෙන ගනියි
   iii). දරුවන් සමඟ කථා කිරීමේදී ඔවුන් ලබන උත්තේජනයන් තුලින් කථාවට දිරිමත් වෙයි
   iv). ඔහුගේ කථාව අතරමැදදී ප්‍රශ්න ඇසීමෙන් කථන හැකියාව පරීක්ෂා කල හැකිය
   a) ( i, iii & iv )
   b) ( ii, iii & iv)
   c) ( i, ii & iv )
   d) ( i, ii & iii )

2. කියවීමේ නිපුණතාවයන් වර්ධනය සඳහා මූලිකවම අවශ්‍ය වනුයේ;
   i). දරුවාතුල ඇති කියවීමේ ලැදියාව,වමේ සිට දකුණට අතේ හුරුව, හොඳ පෙනීම,මනා දෘෂ්ටි විභේදනය.
   ii). නිවැරදි පෙනීම, වමේ සිට දකුණට ඇසේ හුරුව, දරුවාතුල ඇති කියවීමේ ලැදියාව, මනා ශ්‍රවණ විභේදනය.
   iii). දරුවා තුල ඇති කියවීමේ ලැදියාව, හොඳ පෙනීම, වමේ සිට දකුණට ඇසේ හුරුව, මනා දෘෂ්ටි විභේදනය.
   iv). නිවැරදි පෙනීම, වමේ සිට දකුණට ඇසේ හුරුව, මනා දෘෂ්ටි විභේදනය දරුවාතුල ඇති සවන්දීමේ ලැදියාව.
   මින් නිවැරදි වන්නේ;
   a) ( i, ii)
   b) ( ii, iii)
   c) ( iii, iv )
   d) ( i, iv)

3. පියාජේට අනුව ප්‍රතිභා චින්තන අවධියේ දරුවකු තුල දැකියහැකි චරිත ලක්ෂණ වනුයේ;
   a) ඔහුගේ විශ්වාසයන් හා ක්‍රියාකාරකම් සඳහා අර්ථ දැක්වීමට පටන් ගනියි.
   b) වස්තූන්හි ලක්ෂණ කිහිපයක් යටතේ වර්ග කිරීමට ඔහුට හැකියාව ඇත.
   c) ඔහුට තේරුම් ගත හැක්කේ එක් වතාවකට එක් සම්බන්ධතාවයක් පමණි.
   d) ඔහු භාෂාව ඉගෙනීමට හා අනුකරණ ක්‍රීඩාකිරීමට ආරම්භ කරයි.

4. පෙර පාසල් දරුවන්ගේ චිත්‍ර නිර්මාණ ඇගයීමේදී, ගුරුවරිය විසින් වඩා සැලකිලිමත්විය යුත්තේ;
   a) පාඩම් සැලසුමට අදාල තේමාවටය.
   b) අනෙකුත් දරුවන්ගේ චිත්‍ර නිර්මාණ හා සමගයි.
   c) එම දරුවා විසින්ම කලින් කරන ලද නිර්මාණ සමග.
   d) පාඩමට අදාල ඉගෙනුම් ඵල සමඟයි.

Wondershare PDFelement

5. පෙර පාසල් දරුවාගේ සමස්ථ සංවර්ධන ක්‍රියාවලියට අඩංගුවන සංවර්ධන පරාසයන් වනුයේ;
   a) මානසික, චිත්ත වේග, සමාජීය,අධ්‍යාත්මික, ශාරීරික, බුද්ධිමය අගයන්ය
   b) අධ්‍යාපනික, සමාජීය, මානසික, අධ්‍යාත්මික, ශාරීරික, සංස්කෘතික අගයන්ය
   c) සමාජීය, මානසික, ශාරීරික, චිත්තවේග,සංස්කෘතික හා අධ්‍යාපනික අගයන්ය
   d) චිත්ත වේග, සමාජීය, මානසික, අධ්‍යාත්මික, ශාරීරික, සංස්කෘතික අගයන්ය.

6. මොන්ටසෝරි න්‍යායේ මූලික මූලධර්ම හා සංකල්ප අනුපිලිවෙල වනුයේ;
   a) ස්වාධීනත්වය, නිරීක්ෂණය, පසුවිපරම, නිවැරදි කිරීම, සකස්කරනලද පරිසරය හා උරාගැනීමේ මනස.
   b) ස්වාධීනත්වය, නිරීක්ෂණය, නිවැරදි කිරීම, සකස්කරනලද පරිසරය, පසුවිපරම හා උරාගැනීමේ මනස.
   c) නිරීක්ෂණය, ස්වාධීනත්වය, පසුවිපරම, නිවැරදි කිරීම, ස්වාභාවික පරිසරය හා උරාගැනීමේ මනස.
   d) සකස්කරනලද පරිසරය, ස්වාධීනත්වය, පරීක්ෂණය, පසුවිපරම, නිවැරදි කිරීම හා උරාගැනීමේ මනස.

7. ශරීරය තුල හීමොග්ලොබින් නිෂ්පාදනය හා අස්ථීන් හා දත් සකස් කිරීමටත් සහය වන පෝෂක පදාර්ථය වන්නේ;
   a) ප්‍රෝටීන්.
   b) කාබොහයිඩ්රේට්ස්.
   c) විටමින්.
   d) ඛණිජ ලවණ.

8. පෙර පාසල් ගුරුවරිය මානව සම්පත් කළමනාකරණය ගැන දැනගත යුත්තේ;
   a) පෙර පාසලේ දරුවන් තේරුම් ගැනීමට හා ඔවුන්ට උසස් ප්‍රතිඵල ලබාදීමට.
   b) දෙමාපිය රැස්වීම් පවත්වා ඔවුන්ට මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමට.
   c) පෙර පාසල් දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට ඔවුන් සුදුසු පරිදි හැසිරවීමට.
   d) පෙර පාසලේ අනෙක් අය සමග සහයෝගයෙන් පොදු අරමුණ උදෙසා කටයුතු කිරීමට.

9. දෙමාපියන් සමඟ මත ගැටුමකදී ගුරුවරිය විසින්;
   a) අදාල පාර්ශවයන් සමග සබඳතාවයන් අත්හිටවීම.
   b) ඉහළ කළමනාකාරිත්වය දැනුවත් කිරීමට කටයුතු කිරීම.
   c) සහෝදර ගුරුවරියන්ට දැනුම් දී ඔවුන්ගේ උපදෙස් අනුව කටයුතු කිරීම.
   d) තම පන්තියේ දරුවන් සමග ඒ පිළිබඳව සාකච්චා කිරීම.

10. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ;
   a) දරුවාට අකුරු ලිවීමට, කියවීමටත් ගණිතය හා පරිසරයත් උගන්වයි.
   b) ළමා සංවර්ධන අවධීන්ට සමගාමී ලෙසින් දරුවාගේ සංවර්ධනය සිදු කරයි.
   c) දරුවා උපදිනවිට මොළය සංවර්ධනයවී අවසන් නිසා ඒ අනුව ක්‍රියාකාරකම් කරයි.
   d) දරුවන්ගේ හැසිරීම් ආරය මත සිදුවන නිසා පරිසර ක්‍රියාකාරකම් වැදගත් නොවෙයි.

11. පෙර ලිවීමේ කුසලතා වර්ධනයට අවශ්‍ය වන්නේ;
   i). දුටු හැඩරුව මතකයේ තබාගැනීමටයි.
   ii). ඇස් හා අත් සමායෝජනය පුරුදු කිරීමටයි.
   iii). සංකල්ප පැහැදිලිව අවබෝධ කර වීමටයි.
   iv). ඇඟිලි පහසුවෙන්මෙහෙයවීම හුරු වීමටයි.
   a) i, ii, iii
   b) ii, iii, iv
   c) i, iii, iv
   d) i, ii, iv

Wondershare
PDFelement

12. විවිධ වස්තූන්හි විශේෂිත ලක්‍ෂණ පිළිබඳ ළමයාගේ අවධානය යොමු කරවීම තුලින් දරුවන්ගේ එකිනෙකාට වෙනස් වූ බුද්ධි මට්ටම් හා හැකියාවන් හඳුනාගැනීමට ගුරුවරියට අවස්ථාවක් උදාකර ගැනීමටත් හැකිවන ගණිත සංකල්පයක් වන්නේ;
   a) එකට එක අනුරූපිතාවය
   b) හැඩතළ
   c) වර්ගීකරණය
   d) අසර

13. ඩැනියල් ගෝල්මන්, හොවාර්ඩ් ගාඩ්නර්, ඒබ්‍රහම් මස්ලෝ යන විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කරන ලද න්‍යායන් පිළිවෙලින් වනුයේ;
   a) සම්භාව්‍ය ආරෝපන, චිත්තවේග බුද්ධිය, අත්දැකීම් කේතුව.
   b) සමාජ ඉගෙනුම්, බහුවිධ බුද්ධිය, සම්භාව්‍ය ආරෝපන.
   c) අත්දැකීම් කේතුව චිත්තවේග බුද්ධිය, සමාජ ඉගෙනුම්.
   d) සම්භාව්‍ය ආරෝපන,සමාජ ඉගෙනුම්, බහුවිධ බුද්ධිය.

14. පෙර පාසල තුල පරිසර මුල්ල ස්ථාපිත කිරීමේදී තිබිය යුතු දේවල් වන්නේ;
   a) ගල් වර්ග, වැලි වර්ග, ඇට වර්ග, කුරුළු පිහාටු,හිස් ටින්, පස් වර්ග.
   b) ගල් වර්ග, පැස්ටල් කූරු, ඇට වර්ග, කුරුළු පිහාටු, පස් වර්ග.
   c) ගල් වර්ග, වැලි වර්ග, ආභරණ වර්ග, කුරුළු පිහාටු, පස් වර්ග.
   d) ගල් වර්ග, වැලි වර්ග, ඇට වර්ග, කුරුළු පිහාටු, පස් වර්ග.

15. ආහාර වල ඇති පෝෂ්‍ය පදාර්ථ වන්නේ;
   a) ප්‍රෝටීන්, මේදය, කාබෝහයිඩ්‍රේට්, විටමින්, ඛණිජ ලවණ, ජලය.
   b) ප්‍රෝටීන්, මේදය, කාබෝහයිඩ්‍රේට්, විටමින්, යකඩ, ජලය.
   c) ප්‍රෝටීන්, මේදය, කාබෝහයිඩ්‍රේට්, විටමින්, කැල්සියම්, ජලය.
   d) ප්‍රෝටීන්, මේදය, කාබෝහයිඩ්‍රේට්, විටමින්, පොටැසියම්, ජලය.

16. අපිරිසිදු ජලය පානය නිසා බෝවන රෝග වන්නේ;
   a) ඩෙංගු, පාචනය. අතීසාරය
   b) මැලේරියාව, උනසන්නිපාතය, සෙංගමාලය
   c) උණ, මැලේරියාව, ඩෙංගු රක්තපාත උන.
   d) පාචනය, සෙංගමාලය,අතීසාරය.

Wondershare
PDFelement

17. ශ්‍රවණ විභේදනය පිළිබඳ දැනගතයුතු මූලික කරුණු වන්නේ;
   i). එක් එක් ළමයාගේ ශබ්ද වෙන්කොට හඳුනාගැනීමේ කුසලතාව විවිධ මට්ටම් වල පවතින බව.
   ii). වචනවල නිශ්චිත ශබ්දයක් ඇතිබවත් එම ශබ්දයම වචනයක එක් වරකට වඩා යෙදියහැකිබව.
   iii). ශ්‍රවණ විභේදන කුසලතා දියුණුවත් සමග ළමයා භාෂාව වැඩියෙන් ශබ්ද නගමින් ඒවා හඳුනා ගනියි.
   iv). ශ්‍රවණ විභේදන යනු ශබ්ද දෙකක් අතර ඇති වෙනස්කම් හඳුනා ගැනීමයි.
   a) i, ii & iii
   b) ii, iii & iv
   c) iii, iv & i
   d) i, ii & iv

18. සමබල ආහාර වල අඩංගු පෝෂක කොටස් වර්ගීකරණය වන්නේ;
   i). ශරීර වර්ධක ආහාර.
   ii). ශරීර බර වැඩිකරන ආහාර.
   iii). ශක්ති ජනක ආහාර.
   iv). ලෙඩ රෝගවලින් ආරක්‍ෂාව සලසන ආහාර.
   a) i, ii & iii
   b) ii, iii & iv
   c) i, iii & iv
   d) i, ii & iv

Wondershare PDFelement

19. දරුවන්ගේ ප්‍රගතිය වාර්තා කිරීමේ ක්‍රම වන්නේ;

i). එක් එක් ළමයා පිළිබඳව තොරතුරු සටහන් කර තැබීම.
ii). පෙර සැලසුම් කල ප්‍රශ්නාවලියකට පිළිතුරු ලබා ගැනීම.
iii). පෙර සැලසුම් කල ප්‍රගති වාර්තා සටහනකට තොරතුරු ඇතුලත් කිරීම.
iv). එක් එක් ළමයා කරන ලද වැඩ වෙන් වෙන්ව රැස්කර තැබීමෙන්.

a) i, ii & iv
b) ii, iii & iv
c) i, iii, iv
d) ඉහත සඳහන් සියල්ලම.

20. හොඳ සෞඛ්‍ය සම්පන්න පුද්ගලයකු යනු;

a) සතියකට දින 3 ක් උදෙන්ම අවදිවී ඇවිදීමේ ව්‍යායාමවල යෙදෙන අයකුවේ.
b) ශාරීරික, මානසික හා අධ්‍යාත්මික වශයෙන් පිරිපුන් පුද්ගලයෙකි.
c) ලෙඩ රෝග වලින් තොරව ජීවත්වන අයෙකි.
d) හොඳ පෝෂ්‍යදායී ආහාර තුන් වේලටම ගන්නා පුද්ගලයෙකි.

21. "පෝෂණය" යනුවෙන් හැඳින්වෙන්නේ;

a) අප ආහාරයට ගන්නා ශක්ති ජනක ආහාර වේ.
b) දිනපතා ආහාරවේල් තුනක්ම පරිභෝජනය කිරීම වේ.
c) සතියකට තුන් වතාවක් අඛණ්ඩව ව්‍යායාම් වල යෙදීම වේ.
d) ශරීරයේ වර්ධනයට හා සංවර්ධනයට අවශ්‍ය ශක්තීන් වේ.

22. "ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය" යනුවෙන් හැඳිවන්නේ;

a) ගුරුවරිය විසින් නිර්මාණය කරන ලද ක්‍රියාකාරකම් දරුවා ලවා කරවීමයි.
b) පංති කාමරය තුල විෂය මාලාවට අදාලව නියමිත ඉගැන්වීම් කිරීමයි.
c) විධිමත් පාසල සඳහා අකුරු හා ඉලක්කම් ඉගැන්වීමයි.
d) දරුවාගේ කැමැත්තට හා හැකියාවලට මුල් තැන දෙමින් ඉගැන්වීම් කිරීමයි.

23. දරුවන් තුල චිත්ත වේග වර්ධනය කිරීමේදී පෙර පාසල් ගුරුවරියගේ භූමිකාව වන්නේ;

i). දරුවාට ඔහුගේම අනන්‍යතාවයක් ගොඩනගා ගැනීම සඳහා ඔහුට සහය වීම
ii). පෙර පාසල් ගුරුතුමිය දරුවාගේ ආදරණීය මව හා සමාන බැව් දැනෙන ලෙස ක්‍රියාකිරීම.
iii). ක්‍රියාකාරකම් තුලින් දරුවන් එකිනෙකාට උදවු කරගැනීමට උනන්දු කරවීම
iv). සුදුසු කතන්දර හා වීඩියෝ වැඩ සටහන් නැරඹීමට අවස්ථාවන් ලබාදීම.

a) i, ii, iii
b) ii, iii, iv
c) i, iii, iv
d) ඉහත සඳහන් සියල්ලම

24. දරුවා මන්ද පොෂණයෙන් පෙළෙන බැව් හඳුනා ගත හැක්කේ;

a) දරුවාගේ ශරීරය ඉතා කෙට්ටු වීම.
b) දරුවා නිතර අසනීප වීම.
c) වයසට නියමිත බර හා උස ප්‍රමාණවත් නොවීම.
d) ආහාර අනුභව කිරීමට රුචියක් නොදැක් වීම.

25. ඉගෙනුම් ක්‍රියාවලිය ඔප්නැංවීම සඳහා යොදාගතහැකි සන්නිවේදන ක්‍රමවේද වන්නේ;

i). නිතරම උස් හඬින් කථා කිරීම.
ii). නිරන්තරයෙන් කාරුණික හා ප්‍රසන්න වචන භාවිත කිරීම.
iii). පැහැදිලි හා නිවැරදි වචන උච්චාරණය කිරීම.
iv). සරල හා දරුවන්ට සමීප වචන භාවිතය.

a) i, ii, iii
b) ii, iii, iv
c) i, iii, iv
d) i, ii & iv

Wondershare PDFelement

26. කතන්දරයක් තෝරා ඉදිරිපත් කිරීමේදී සැලකිල්ලට **නොගතයුතු** කරුණක් වන්නේ;
    a) අවසානය ප්‍රීතිමත් වීම.
    b) ළමා කාටුන් චරිත අඩංගු වීම.
    c) සරල පැහැදිලි වචන භාවිත කිරීම.
    d) ඒ හරහා හොඳ පණිවිඩයක් සන්නිවේදනය කිරීම.

27. "දරුවාගේ ගැලවුම් කාරයා" යන විරුදාවලියෙන් පුදනු ලැබ ඇත්තේ;
    a) ජීන් ජැක් රූස්සෝ (Jean Jacques Rousseau)
    b) ජීන් පියාජේ (Jean Piaget)
    c) මරියා මොන්ටිසෝරි මැතිණිය (Maria Montessori)
    d) ෆෙඩ්රික් ෆෙබෙල් (Frederick J. Fobel)

28. එන්නත් ලබා දීමෙන් වලක්වා ගත හැකි රෝග වන්නේ;
    a) පෝලියෝ, වසූරිය, පැපොල
    b) සරම්ප, පීනස, ඇදුම
    c) වසූරිය, උනසන්නිපාතය,නිව්මෝනියාව
    d) දියවැඩියාව, සරම්ප, සෙංගමාලය.

29. දරුවාගේ නිර්මාණශීලිත්වය වර්ධනය කිරීමෙහිලා ගුරුවරියගේ කාර්ය භාරයක් **නොවනුයේ**;
    a) අගය කිරීම් හා උත්තේජනයන් මගින් උනන්දු කරවීම.
    b) තීන්ත, හුණු, ගම්, කඩදාසි ආදිය නිදහසේ පරිහරණයට අවස්ථා තිබීම.
    c) රූපවාහිණී ළමා කාටූන් නැරඹීමට ඉඩ කඩ ලබා දීම
    d) දරුවා හා දෙමව්පියන් අතර සුහවාදී සබඳතාවයක් තබා ගැනීම.

30. පෙර කියවීමේ නිපුණතාවයන් වර්ධනය කිරීමට අදාල ක්‍රියාකාරකම් වන්නේ;
    i). පොත, පිටුව, පිටු පෙරලීම පියවරෙන් පියවර හඳුන්වා දීම.
    ii). වමේ සිට දකුණට ඇස හුරුකරවීමේ අභ්‍යාස කරවීම.
    iii). පින්තූර කාඩ්පත් හඳුනාගෙන ඒවා නම් කිරීම.
    iv). වමේ සිට දකුණට කඩ ඉරි මත ලියවීම
    a) i, ii, iii
    b) ii, iii, iv
    c) i, iii, iv
    d) i, ii, iv

31. පෝෂණය ලබා දීමේදී ඔබ සැලකිල්ලට ගන්නා කරුණු වන්නේ;
    i). පුද්ගලයකුගේ දිනපතා ක්‍රියාකාරකම්.
    ii). පුද්ගලයකුගේ සමාජ තත්වය.
    iii). පුද්ගලයකුගේ වයස.
    iv). පුද්ගලයකුගේ බර
    a) i, ii, iii
    b) ii, iii, iv
    c) i, iii, iv
    d) i, ii, iv

32. "එකම ශ්‍රේණියේ දරුවන් තිදෙනෙකු එකම තේමාවක් යටතේ ඇඳි චිත්‍ර වල විවිධතාවයන් පෙර පාසල් ගුරුතුමියට දැකිය හැකිය." මෙයට අදාල **නොවන** ප්‍රකාශනය වන්නේ;
    a) දරුවා තම අභ්‍යන්තරික හැඟීම් තමාගේ නිර්මාණය තුලින් නිරූපණය කරයි.
    b) චිත්‍ර මගින් දරුවාට දකින, දැනෙන, සිතෙන හා කථා කරන දේ පිළිබඳ ප්‍රකාශනයක් කරයි.
    c) සම වයස් කාණ්ඩයේ දරුවන්ගේ හැකියාවන් සමාන බැවින් වෙනස් කම් ඇති නොවෙයි.
    d) දරුවන්ගේ තෝරා ගැනීම්, හැඩ ගැන්වීම් හා ඒ පිළිබඳ ඇති විනිශ්චය මෙයින් පිලිඹිඹු වෙයි.

Wondershare PDFelement

Wondershare
PDFelement

33. කුරුටු ගෑම සම්බන්ධයෙන් අදාල **නොවන** ප්‍රකාශය වන්නේ;
   a) කුරුටු ගෑම් තුලින් දරුවා කායික ක්‍රියාවන්හි යෙදී සතුටු වෙයි.
   b) බිත්තිවල හා බිම කුරුටු ගෑම වැලකීම සඳහා පැන්සල් හා පාට කූරු දරුවාට හසු නොවන සේ තැබිය යුතුයි.
   c) තමන් කුරුටු ගෑ දේ පෙන්වමින් ඔහුගේ උදොයෝගය හා සතුට වැඩිහිටියන් සමග බෙදා ගැනීමට උත්සාහ කරයි.
   d) අහඹු කුරුටු ගෑමේ අවධිය අවුරුදු 2 - 2½ කාලය ලෙස හැඳින්විය හැක.

34. දරුවන් සඳහා සැලසුම් කරන වැඩ සටහන් මගින් පෙර පාසල් ගුරුවරියට අපේක්ෂා කල හැකි අරමුණු වන්නේ;
   i). කරුණු නිරීක්ෂණය සඳහා දරුවන්ට මග පෙන්වීම.
   ii). පරීක්ෂණය කරමින් තොරතුරු සෙවීමට යොමු කරවීම
   iii). සුදුසු පරිදි ආකල්ප සංවර්ධනයක්/වෙනසක් ඇතිකිරීම.
   iv). ගුරුවරියට අවනත කීකරු දරු පරපුරක් බිහි කිරීම.
   a) i, ii, iii
   b) ii, iii, iv
   c) i, iii, iv
   d) ඉහත සඳහන් සියල්ලම

35. පෙර පාසල් ගුරුවරියට මනෝවිද්‍යාව පිළිබඳ දැනුවත් වීම අවශ්‍ය වන්නේ;
   i) පෙර පාසල් දරුවාගේ ශාරීරික අංශයන්හි ක්‍රමාණුකූල වර්ධනයට සහය වීම.
   ii) ආත්ම කේන්ද්‍රීය අවධියේ සිටින දරුවන් අතර සිදුවන ගැටුම් අන්‍යෝන්‍ය සහයෝගයෙන් මිත්‍රශීලි වාතාවරණයක් තුල කටයුතු කිරීමට පුරුදු පුහුණු කිරීමට.
   iii) දරුවන්ගේ ළමා මනස හා හැසිරීම් රටාවල වෙනස්කම් හඳුනා ගැනීමට.
   iv) දරුවන්ගේ කටයුතු වලදී සුදුසු පරිදි දෙමාපියන් දැනුවත් කරමින් අවශ්‍ය මග පෙන්වීමට.
   a) i, ii, iii
   b) ii, iii, iv
   c) i,iii, iv
   d) i, ii, iv

Wondershare
PDFelement

36. "පෙර පාසල් අධ්‍යාපනය දෙපක්ෂයටම උපරිම ඵල නෙලා ගත හැක්කේ පාසල දෙමව්පියන්ට විවෘත කර දෙපක්ෂය අතර සමීප සම්බන්ධතාවන් ගොඩ නගා ගතහොත් පමණි." මෙම අදහස මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ;
   a) ජීන් පියාජේ
   b) මාග්‍රට් මැක්මිලන් හා රේෂල් සහෝදරියන් දෙදෙනා.
   c) ජෝන් ඩෙවී
   d) මහත්මා ගාන්ධි

37. පුද්ගලයකු ආහාර වර්ග තෝරා ගැනීමේදී පහත සඳහන් කරුණු ගැන සැලකිල්ලක් දක්වයි. මෙම තීරණය සඳහා වඩාත්ම සුදුසු තේරීමේ අනුපිළිවෙළ විය යුත්තේ;
   **A).** පවුලේ ආර්ථික තත්වය.
   **B).** සමහර ආහාර වර්ග කෙරෙහි ඇති විශේෂ කැමැත්ත.
   **C).** පෝෂණ වටිනාකම.
   **D).** ජනප්‍රියතාවය මත සමහර ආහාර වර්ග වලට ඇති පොදු පිළිගැනීම.
   a) ACBD
   b) CABD
   c) BCAD
   d) CADB

Wondershare PDFelement

38. පෙරපාසල් දරුවන් සඳහා ක්‍රියාකාරකමක් සැලසුම් කිරීමේදී ඔබ විසින් සැලකිලිමත් වියයුත්තේ;
   a) ඨකවරණය, වයස් ඛාණ්ඩය, පෞද්ගලික හැකියාවන්, ආරක්ෂාව.
   b) වයස් ඛාණ්ඩය, සිසුන් සංඛ්‍යාව, පෞද්ගලික හැකියාවන්, ඨකවරණය.
   c) පෞද්ගලික හැකියාවන්, ප්‍රමාණය, ගුණාත්මක බව, ආරක්ෂාව.
   d) ගුණාත්මක බව, ආරක්ෂාව,සිසුන් සංඛ්‍යාව, වයස් ඛාණ්ඩය.

39. පෙර පාසල් අවධියේ සිටම දරුවන්ට හොඳ පුරුදු හා වටිනාකම් අවබෝධ කර දීමට අවශ්‍ය වන්නේ;
   i). පුද්ගලයකුගේ ජීවිතයේ මුල් කාලයේදීම හොඳ පුරුදු පිළිබඳ අවබෝධය ලබා දිය යුතු නිසාය.
   ii). දෙමාපියන් හා වැඩිහිටියන් නොඉගැන්වූ හොඳ පුරුදු පෙරපාසලේදී ඉගැන්විය යුතු නිසා.
   iii). පෙර පාසල් අවධියේදී හඳුන්වාදෙන ඕනෑම දෙයක් මොළයේ ස්ථිරව තැන්පත් වී ඉදිරි ජීවිතයටද බලපාන නිසාය.
   iv). හොඳ පුරුදු ඇති කර ගැනීමේ වාසිය දරුවාට පමණක් නොව හොඳ සමාජීය සබඳතා වලටද පදනමක් වන නිසාය.
   a) i, ii & iii
   b) ii, iii & iv
   c) i,iii, iv
   d) i, ii, iv

40. පෙරපාසල් ගොඩනැගිල්ලේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඔබට ගත හැකි ක්‍රියා මාර්ග වන්නේ;
   a) ගොඩනැගිල්ල කාලීනව පරීක්ෂාකිරීම, විදුලි පරිපථය අඛණ්ඩව පරීක්ෂා කිරීම, සුදුසු අළුත් වැඩියාවන් කිරීම, අවශ්‍ය තාක්ෂණික වාර්තා ලබාගැනීම.
   b) විදුලිය විසන්ධවීම පරීක්ෂා කිරීම, කාලීනව පරීක්ෂාකිරීම,ගොඩනැගිල්ලේ සායම් ආලේප කිරීම, සුදුසු අළුත් වැඩියාවන් කිරීම.
   c) සුදුසු අළුත් වැඩියාවන් කිරීම, ජල කාන්දුවීම සඳහා වහලය පරීක්ෂාකිරීම, ගොඩනැගිල්ලේ සායම් ආලේප කිරීම, පාසල් වත්ත කාලීන පරීක්ෂාකාරීම..
   d) ගොඩනැගිල්ලේ සායම් ආලේප කිරීම, කාලීනව පරීක්ෂාකිරීම, විදුලි පරිපතය අඛණ්ඩව පරීක්ෂා කිරීම, අළුත් වැඩියාවන් කිරීම.

Wondershare PDFelement

41. පියාජේට අනුව පූර්ව ක්‍රියාකාරී අවධියේ අනු කොටස් වන්නේ;
   a) ඉන්ද්‍රිය චාලක අවධිය හා පූර්ව සංකල්ප අවධිය.
   b) පූර්ව සංකල්ප අවධිය හා ප්‍රතිභා චින්තන අවධිය.
   c) ප්‍රතිභා චින්තන අවධිය හා සංයුක්ත ක්‍රියාකාරී අවධිය.
   d) පූර්ව සංකල්ප අවධිය හා විධිමත් ක්‍රියාකාරී අවධිය.

42. දරුවන්ට දඬුවම් ලබාදීම සම්බන්ධව රූස්සෝගේ මතය වූයේ;
   a) ළමා ප්‍රඥප්තිය අනුව ළමුන්ට දඬුවම් දීම නීති නිරෝධී ක්‍රියාවක් බැවින් ඔවුන්ට දඬුවම් නොකිරීමට වග බලා ගත යුතුය.
   b) දරුවා කිසිම විටක දඬුවම් නොලැබිය යුතුඅතර වැරදි සඳහා ස්වාභාවිකව ලබන ප්‍රතිවිපාක වලින්ම ඉගෙන ගන්නා බව.
   c) දරුවාට දඬුවම් දීම ප්‍රසිද්ධියේ නොකල යුතු අතර පෞද්ගලිකව ඔහු සමග සාකච්චා කර සුදුසු දඬුවම් ලබාදීම කල යුතුයි.
   d) දරුවන්ට දඬුවම් ලබා දීමට හැක්කේ දෙමව්පියන්ට හා ගුරුවරුන්ට පමණි. එය හුදෙක් වරදක් නිවැරදි කරගැනීමේ අටියෙන්ම සිදු කල යුත්තකි.

43. වටිනාකම් ප්‍රදර්ශනය කරන අවස්ථාවක් ලෙස හැඳින්විය හැක්කේ;
   a) අධ්‍යාපන කටයුතු සඳහා උනන්දුවක් හා සුහවාදී සහභාගිත්වයක් දැක්වීම.
   b) තමාගේ හා අන් අයගේ සංස්කෘතීන් හා සිරිත් විරිත් අගයකිරීම..
   c) පාසලේ උපකරණ හා දේවල් ආරක්ෂා කිරීමට සාමූහික වගකීමකින් කටයුතු කිරීම
   d) කණ්ඩායම් ක්‍රියාකාරකම් වලදී සහයෝගයෙන් කටයුතු කිරීමට උත්සාහ කිරීම.

Wondershare PDFelement

44. හසුරු ක්‍රියාකාරකම් වර්ධනය තුලින් ලබාගත හැකි දිගු කාලීන ඉලක්ක වන්නේ;
   i) බුද්ධි සංවර්ධනය උත්තේජනය වීම.
   ii) ආත්ම විශ්වාසයට හා ස්වයං පාලනයට පදනමක් වීම.
   iii) දරුවා තුල ස්වයං චින්දනයක් ඇති කිරීමට සහයවීම.
   iv) සියුම් මාංශ පේශීන් පාලනය කිරීමට සහයවීම.
      a) i, ii, iii
      b) i, iii, iv
      c) ii, iii, iv
      d) i, ii, iv

45. ශරීරයට ශක්තීන් ලබාදෙන ආහාර වන්නේ;
      a) බත්, අර්තාපල්, කොස්, පාන්. බතල
      b) හරක් මස්, සෝ බෝංචි, මාළු, පරිප්පු.
      c) ගොටුකොල, දිවුල්, මඤ්ඤොක්කා, සිරියල්.
      d) කිරි, තිරිඟුපිටි, අර්තාපල්, බිත්තර

46. පෙර පාසල් දරුවන්ට විවිධ ක්‍රම යටතේ ඉගෙනුම් කරයි. එම ඉගෙනුම් ක්‍රමයන්ට අයත් වන්නේ;
   i) යමක් ගවේෂණය හා නිරීක්‍ෂණය කිරීම
   ii) යමක් පැහැදිළි කරමින් ඉගැන්වීම.
   iii) තත්වරද ක්‍රමය.
   iv) සිද්ධි අධ්‍යයනය.
      a) i, ii, iv
      b) ii, iii, iv
      c) i, iii, iv
      d) ඉහත සඳහන් සියල්ලම.

47. දරුවා ඔබට පවසන කතන්දර ඔබ ශ්‍රවණය කරන අතරතුර ඔබ අවධානය යොමුකරන කරුණු තුන වන්නේ;
   a) අනුපිළිවෙළ, සිරුරු බස, හැඟීම් ප්‍රකාශනය
   b) තානය හෙවත් විලාශය, හැඟීම් ප්‍රකාශනය, සිරුරු බස
   c) හැඟීම් ප්‍රකාශනය, නැවත නැවත කීම, ළදරු කතා
   d) අනුපිළිවෙළ, සිරුරු බස, වචන ගැළපීම

48. ළමා මනෝ විද්‍යාඥයින් විසින් සංවර්ධන අදියර හතරක් ඔස්සේ ළමයාගේ හැකියාවන් මැන බලයි. එම හතර වන්නේ;
   a) සංකල්ප වර්ධන අදියර, කායික අදියර, සන්නිවේදන හා භාෂා අදියර, ප්‍රජානන අදියර
   b) ප්‍රතිභා චින්තන අදියර, ප්‍රජානන අදියර, සංකල්ප වර්ධන අදියර, මානසික රටා අදියර
   c) කායික අදියර, ප්‍රජානන අදියර, සමාජ චිත්තවේගීය අදියර, සන්නිවේදන හා භාෂා අදියර
   d) මානසික රටා අදියර, සංකල්ප වර්ධන අදියර, කායික අදියර, සමාජ චිත්තවේගීය අදියර

49. ළමා මිතුරු පරිසරයක දැක්වෙන පාරිසරික ලක්ෂණ හතරක් වන්නේ;
   a) ඉගෙනුම් පරිසරය, මනෝ විද්‍යාත්මක පරිසරය, සදාචාරාත්මක පරිසරය, භෞතික පරිසරය
   b) ජීව පරිසරය, භෞතික පරිසරය, සදාචාරාත්මක පරිසරය, ප්‍රජානන පරිසරය
   c) භෞතික පරිසරය, ජීව පරිසරය, මනෝ විද්‍යාත්මක පරිසරය, ඉගෙනුම් පරිසරය
   d) භෞතික පරිසරය, සමාජීය පරිසරය, මනෝ විද්‍යාත්මක පරිසරය, ඉගෙනුම් පරිසරය

50. ඉගෙනුම් උපකරණ භාවිතා කිරීමේදී ගුරුවරිය විසින් අවධානය යොමුකළ යුතු කරුණු වන්නේ;
   a) ආරක්ෂාව, කාර්ය සඳහා පෙළඹවීම, අවධානය රඳවා ගැනීම, භාවිතා කිරීමේ අනුපිළිවෙළ
   b) භාවිතා කිරීමේ අනුපිළිවෙළ, ආරක්ෂාව, සිසුන් සංඛ්‍යාව, අවධානය රඳවා ගැනීම
   c) සිසුන් සංඛ්‍යාව, ආරක්ෂාව, අවධානය රඳවා ගැනීම,ප්‍රතිපෝෂණය
   d) ආරක්ෂාව, ගුණාත්මක බව, භාවිතා කිරීමේ අනුපිළිවෙළ, කාර්ය සඳහා පෙළඹවීම

(01 x 50 = ලකුණු 50)



Wondershare PDFelement

Wondershare PDFelement



තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
වෘත්තීය දැනුම ඇගයීමේ පරීක්ෂාව- 2022 අප්‍රේල්
පෙරපාසල් ගුරු
ජාතික වෘත්තීය සුදුසුකම - 4 වන මට්ටම

කාලය - පැය 03

**විභාග අපේක්ෂකයන් හට උපදෙස්**

- පළමු (01) ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න. (පළමු (01) ප්‍රශ්නය අනිවාර්ය වන අතර පිළිතුරු ලබාදිය යුතු මුළු ප්‍රශ්න ගණන පහක් (05) විය යුතුය).
- මෙම කොටස සඳහා පිළිතුරු සැපයීම සඳහා, ප්‍රශ්න පත්‍රයේ දී ඇති ඉඩ භාවිතා කරන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයෙහි පිටු 07 ක් අඩංගු වේ.

---

## 2 කොටස

1.

i). පෙරපාසල් ළමයා යනු කවුද?

(ලකුණු 02)

ii). ඔහුගේ විශේෂ ගති ලක්ෂණ 3 ක් දක්වන්න.

(ලකුණු 03)

Wondershare PDFelement

iii). පෙර පාසල් ගුරුවරිය හා ළමයා අතර තිබිය යුතු විශේෂ සම්බන්ධතා 5 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

Wondershare
PDFelement

2.

i). සෞන්දර්ය නිපුනතා සංවර්ධනය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 02)

ii). සෞන්දර්ය නිපුනතා සංවර්ධනය තුලින් පෙරපාසල් දරුවාට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් (4) සඳහන් කරන්න.

(ලකුණු 04)

Wondershare
PDFelement

iii). ඉහත දැක්වූ ප්‍රතිලාභ 4 වර්ධනය කිරීම සඳහා අදාල සෞන්දර්ය ක්‍රියාකාරකම් 4ක් සඳහන් කරන්න.

(ලකුණු 04)

Wondershare
PDFelement

3.

i). “පරිසර ගවේශණය” යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද?

(ලකුණු 02)

ii). පරිසර ගවේශණය තුලින් පෙරපාසල් දරුවාට ලබාගතහැකි වාසි 04ක් දක්වන්න

(ලකුණු 04)

Wondershare
PDFelement

iii). පරිසරය ගවේශණය සඳහා දරුවන් උනන්දුකරවීමට ඔබ යොදාගන්නා ක්‍රම 04ක් දක්වන්න.

(ලකුණු 04)

Wondershare
PDFelement

4.

i). පෙර පාසල් දරුවන් ලිවීමට හුරු කරවීමේදී ඔවුන්තුල වර්ධනය කලයුතු නිපුනතා 4 ක් සඳහන් කරන්න.

(ලකුණු 04)

ii). මෙයින් නිපුනතා 2 ක් තෝරාගෙන අදාල නිපුනතා 2 වර්ධනය සඳහා එකකට ක්‍රියාකාරකම් තුනක් (03) බැගින් සඳහන් කරන්න.

(ලකුණු 06)

Wondershare
PDFelement

Wondershare PDFelement

5.

i). “සමෝධානික” ඉගෙනුම් ප්‍රවේශය යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද?

(ලකුණු 03)

ii). කුරුල්ලන් තේමාව යටතේ සමෝධානික ඉගෙනුම් සැලැස්මක් සකස් කරන්න.

(ලකුණු 05)

Wondershare PDFelement

iii). ඉහත ඉගෙනුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ඔබ භාවිච්චි කිරීමට බලාපොරොත්තු වන ඉගෙනුම් ආධාරක/උපකරණ අටක් (08) නම් කරන්න.

(ලකුණු 02)

Wondershare PDFelement

6.

i). පෙර පාසල් දරුවන්ට ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමේදී හැකි තරම් දුරට ඉවතලන ද්‍රව්‍ය භාවිතා කිරීම සුදුසු වන්නේ ඇයි? පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ii). ක්‍රියාකාරකම් සඳහා ඉවතලන දෑ භාවිත කිරීමෙන් දරුවන්ට ලැබෙන ප්‍රතිලාභ 4ක් සඳහන් කරන්න.

(ලකුණු 02)

Wondershare PDFelement

iii). දරුවන්ගේ නිර්මාණ ශිලි හැකියාවන් වර්ධනයෙහිලා ඉවතලන ප්ලාස්ටික් බෝතල් භාවිතා කරමින් කිසියම් නිර්මාණය කල හැකි අන්දම රූප සටහන් සහිතව පෙන්නුම් කරන්න.

(ලකුණු 03)

Wondershare
PDFelement

iv). එම ක්‍රියාකාරකම තුලින් දරුවන් තුල වර්ධනය කිරීමට අපේක්ෂිත නිපුණතා 4ක් සඳහන් කරන්න.

(ලකුණු 02)

7.

i). ආර්නොල්ඩ් ගැසෙල් ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

(ලකුණු 02)

ii). ඔහුගේ "මේරීමේ න්‍යාය (Maturation theory)" ගැන කෙටි විස්තරයක් කරන්න.

(ලකුණු 03)

Wondershare
PDFelement

iii). මෙම න්‍යායට අනුව යමින් ගුරුවරිය තම ඉගෙනුම් ක්‍රියාවලිය සංවිධානය කරගන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)